# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය (HM 1-1)

HM 1-1 - රු. 80,295 – 15 x 2,270 – 114,345/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 80,295/-

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය / ගණකාධිකරණය/ මූල්‍ය කළමනාකරණය/ වාණිජවේදී උපාධිය.

   සමඟ

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක් ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක “කළමනාකාර මට්ටමේ” තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සේවා (MM) ශ්‍රේණියේ 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05) අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් බල නොපායි.

### 02. කළමනාකරු (කර්මාන්ත ශාලා) - කළමනාකාර සේවා ශ්‍රේණිය (MM 1-1)

MM 1-1 - රු. 53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 53,175/-

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා/ ඉංජිනේරු විද්‍යාවේදී/ නිෂ්පාදන කළමනාකරණය/ විදුලි ඉංජිනේරු විද්‍යාව විෂයන්ගෙන් උපාධියක් ලබාගෙන තිබීම.

   සහ

   උපාධිය ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍යය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික නිෂ්පාදනාගාරයක මාණ්ඩලික මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක යටත් පිරිසෙයින් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

2. තෘතීය/ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත්වෙනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
සහ

මෙම සුදුසුකම් ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍යය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ඖෂධ නිෂ්පාදනාගාරයක මාණ්ඩලික මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**</u>

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM 1-1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>**වයස**</u>

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

**03. කළමනාකරු (පිරිවැය) - කළමනාකාර සේවා ගණය (MM 1-1)**

MM 1-1 - රු. 53175 – 10 x 1375 – 15 x 1910 – 95,575/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 53,175/-

<u>**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**</u>

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද ගණකාධිකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ මූල්‍ය කළමනාකරණය යන විෂයන්ගෙන් ලබාගත් උපාධිය
සහ

උපාධිය ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍යය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පිරිවැය කරණයට අදාළ මාණ්ඩලික මට්ටමේ තනතුරක යටත් පිරිසෙයින් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් වෘත්තීය ආයතනයක අන්තර්මධ්‍යම පරීක්ෂණය (Intermediate Level) සමත්වීම.
සහ

එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ අර්ධ රාජ්‍යය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණය හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ මාණ්ඩලික මට්ටමේ තනතුරක යටත් පිරිසෙයින් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**</u>

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM 1-1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>**වයස**</u>

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවෙයි.

**04. කළමනාකරු (සැපයුම්) - කළමනාකාර සේවා ගණය (MM 1-1)**

MM 1-1 - රු. 53175 – 10 x 1375 – 15 x 1910 – 95,575/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 53,175/-

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වාණිජ්‍යය/ අලෙවිකරණය/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය යන විෂයන්ගෙන් ලබාගත් උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍යය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සැපයීම් හා ද්‍රව්‍ය කළමනාකරණය හෝ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයට අදාළ තනතුරක යටත් පිරිසෙයින් වසරක (01) පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM 1-1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවෙයි.

**05. සහකාර කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)**

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ/ අලෙවිකරණ/ වාණිජ්‍යය උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවෙයි.

## 06. ගිණුම් නිලධාරි - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**<u>බාහිර අයදුම්කරුවන් (පහත 1, 2 හෝ 3)</u>**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය හා මූල්‍යකරණය විශේෂායන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ ශ්‍රී ලංකා වරලත් වෘත්තිය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්ව තිබීම.

3. උසස් ජාතික ගණකාධිකරණ (HNDA) සිව් අවුරුදු (04) ඩිප්ලෝමාව ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1, 2 හෝ 3)</u>**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. කළමනාකරණ සහකාර තාක්ෂණ (MA 2-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**<u>වයස</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාක්ව අදාළ නොවෙයි.

## 07. සැපයුම් නිලධාරි - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වාණිජ්‍යය/ අලෙවිකරණය/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපාර පරිපාලන/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය යන විෂයන්ගෙන් ලබාගත් උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)</u>**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ සැපයුම් ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවෙයි.

**08. පරිපාලන නිලධාරි - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)**

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත්/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මානව සම්පත් කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ මානව සම්පත්/ පරිපාලන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාක් අදාළ නොවෙයි.

**09. ව්‍යාපෘති නිලධාරි - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)**

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ සැලසුම්/ ව්‍යාපෘති ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**<u>වයස</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාක් අදාළ නොවෙයි.

**10. පරිගණක හා දත්ත නිලධාරි - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1)**

JM 1-1 - රු. 42600 – 10 x 755 – 18 x 1135 – 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2025.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,600/-

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යා උපාධියක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිගණක පද්ධතීන් වලට අදාළ ක්ෂේත්‍රයක වසර දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි NVQ හයවැනි (06) හෝ NVQ හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි NVQ පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකස් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)</u>**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 2-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ පරිගණක ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.